*[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]*

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama සමානර්ථයක් Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | විෂයය - භූගෝල විද්‍යාව | පත්‍රය I | පැය - 01 යි. |
|---|---|---|---|

**නම** ..............................................................................................................................................

**සැලකිය යුතුයි.**

- මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විත ය.
- එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව ප්‍රශ්නවලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.

- අංක **01** සිට **10** දක්වා ප්‍රශ්නවලට එක් එක් හිස්තැනට **ගැලපෙන** පිළිතුර **වරහන් තුළින්** තෝරා **තිත් ඉර** මත ලියන්න.

01. පෘථිවිය මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් මිලියන .......................... කි.

    (510 / 410 / 820)

02. පෘථිවි කබොල හා ප්‍රාවරණයේ ඉහළ කොටස ඇතුළත් කලාපය .............................................. වේ.

    (ශිලා ගෝලය / ජල ගෝලය / වායු ගෝලය)

03. ප්‍රාවරණය හා හරය වෙන් කරන සීමාව ................................................... ලෙස හඳුන්වයි.

    (ගුටෙන්බර්ග් ආසන්තතිය / මොහොරෝවිසික් ආසන්තතිය / ශිලා ගෝලය)

04. ඩෙකෑන් යනු .............................. ප්‍රධාන උදාහරණයකි.

    (සානුවකට / නිම්නයකට / කඳු වැටියකට)

05. තේම්ස් ගඟ ආරම්භ වන්නේ ...................................................

    (විලකිනි / උල්පතකිනි / ගැලැසියර දිය වූ ජලයෙනි)

06. .................................................. යනු ප්‍රධාන වී පර්යේෂණ ආයතනයකි.

    (බෝම්බුවල / රත්මිනිතැන්න / ලුණුගම්වෙහෙර)

07. පොල් ත්‍රිකෝණය ලෙස හැඳින්වෙන්නේ කුරුණෑගල, හලාවත ........................................ ය.

    (කොළඹ / ගම්පහ / පොලොන්නරුව)

08. මුල්ම රබර් පැලය රෝපණය කරන ලද්දේ ...................................................

    (ගම්පහ හෙනරත්ගොඩ උද්‍යානයේ / පේරාදෙණිය උද්භිද උද්‍යානයේ / හග්ගල උද්‍යානයේ)

09. ඕසෝන් ස්ථරය පිහිටා ඇත්තේ ................................................ තුළ ය.

    (පරිවර්තී ගෝලය / මෙසෝ ගෝලය / අපරිවර්තී ගෝලය)

10. බිම් ඒකකයකින් ලබා ගන්නා අස්වැන්න අඩු වීම ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තයේ ............................................ ආශ්‍රිත ගැටලුවකි.

    (නිෂ්පාදනය / වෙළඳාම / භූමි පරිභෝගය)

- අංක **11** සිට **15** දක්වා තෙක් දී ඇති එක් එක් ප්‍රකාශය **නිවැරදි නම්' නි'** යන්න වටා ද **වැරදි** නම් **'වැ'** යන්න වටා රවුමක් අඳින්න.

11. හරිත විප්ලවයේ බලපෑම නිසා 1960 දශකයේ වී වගාව විශාල වශයෙන් දියුණු විය. (නි / වැ)
12. විශේෂ ගුණාංගවලින් යුත් සහල් වර්ගයකි රත් සහල්. (නි / වැ)
13. සම්පූර්ණයෙන් ම ගොඩබිමෙන් වට වූ මුහුදකි රතු මුහුද (නි / වැ)
14. පෘථිවි ගෝලය මත ව්‍යාප්තව ඇති මිරිදිය පිරුණු විශාල ජල ප්‍රදේශය සාගර නම් වේ. (නි / වැ)
15. කර්කටක නිවර්තනය හා ආක්ටික් වෘත්තය අතර පිහිටා ඇත්තේ නිවර්තන කලාපයයි. (නි / වැ)

- අංක **16** සිට **20** තෙක් දී ඇති ප්‍රශ්නවල අ සහ ආ යනුවෙන් තීරු දෙකක් ඇත. ඒවා සම්බන්ධතාවය අනුව ගැලපූ විට පිළිතුරට හිමි අංකය තිත් ඉර මත ලියන්න.

16.

| "අ" | "ආ" |
|---|---|
| 1. කඳුවැටි | A. අත්ලන්තික්, පැසිපික් |
| 2. මුහුදු | B. මහාබාධක, අන්දීස් |
| 3. සාගර | C. මධ්‍යධරණී, කැස්පියන් |
| | D. බෝල්ටික්, අත්ලන්තික් |

(1). ABC (2). BCA (3). BDA (4). DCA (.............)

17.

| "අ" | "ආ" |
|---|---|
| 1. නයිල් ගඟ | A. උල්පතකින් |
| 2. රයින් ගඟ | B. කඳුකර ප්‍රදේශයක උල්පතකින් |
| 3. තේම්ස් ගඟ | C. විලකින් |
| 4. මහවැලි ගඟ | D. ග්ලැසියර දියවූ ජලයෙන් |

(1). BACD (2). CADC (3). DACB (4). CDAB (.............)

18. පෘථිවි ව්‍යුහයේ ගැඹුර

| "අ" | "ආ" |
|---|---|
| 1. කබොල | A. මතුපිට සිට 2900 km ගැඹුර |
| 2. ප්‍රාවරණය | B. ප්‍රාවරණයේ සිට 2250 km |
| 3. පිටත හරය | C. සාගරවලදී 5 km මහාද්වීපවලදී 60 km |
| | D. ප්‍රාවරණයේ සිට 1220 km |

(1). CAB (2). BAC (3). CAD (4). DAC (.............)

19. පහත දැක්වෙන විල් පිහිටි මහාද්වීප වන්නේ,

| "අ" | "ආ" |
|---|---|
| 1. බයිකල් විල | A. දකුණු ඇමරිකාව |
| 2. පංචමහා විල් | B. ආසියාව |
| 3. ටිටිකාකා | C. උතුරු ඇමරිකාව |
| 4. අයර් විල | D. ඕස්ට්‍රේලියාව |

(1). DABC (2). BCAD (3). ACBD (4). CBAD (.............)

20. ශ්‍රී ලංකාවේ වගා කරනු ලබන බෝග කිහිපයකට අවශ්‍ය වර්ෂාපතනය නිවැරදිව ගලපන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. රබර් | A. 2000 mm – 2500 mm අතර |
| 2. තේ | B. 1900 mm – 5400 mm අතර |
| 3. පොල් | C. 2000 mm ට වැඩි |
| | D. 3000 mm ට වැඩි |

(1). CAB (2). BAC (3). CAD (4). DAC (.............)

- අංක **21** සිට **30** තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

21. ගොඩබිම පිහිටි ජලය පිරි ආවාට ................................................ නමින් හැඳින්වේ.

22. ජාවා, සුමාත්‍රා වැනි දූපත් ................................................ මහාද්වීපක තටකය තුළ පිහිටා ඇත.

23. මහාද්වීපික කබොල ........................................................ පාෂාණවලින් සමන්විත ය.

24. ප්‍රභාසංස්ලේෂණය සඳහා අවශ්‍ය හිරුඑළිය ලැබෙන සාගර පතුල් සීමාව ................................................ නම් වේ.

25. 1:50000 සිතියමක සමෝච්ච රේඛා අන්තරය වන්නේ .................................................... කි.

26. දෙවුන්දර තුඩුව සිට පේදුරු තුඩුව දක්වා දිග වන්නේ ................................................ කි.

27. ලුණු මිශ්‍ර වැලි පස හා රැලිබිම් වඩාත් යෝග්‍ය වන්නේ ................................................ ටයි.

28. ප්‍රධාන රබර් වගා කරන දිස්ත්‍රික්ක 3 වනුයේ කෑගල්ල, ..........................................., කළුතර වේ.

29. තේ පර්යේෂණ ආයතනය පිහිටා ඇත්තේ ................................................ ය.

30. කඳුකර ප්‍රදේශවල වී වගා කරන ක්‍රමය හඳුන්වන්නේ ................................................ නමින්.

- අංක **31** සිට **40** දක්වා වූ ප්‍රශ්නවලට **නිවැරදි** පිළිතුර යටින් ඉරක් අඳින්න.

31. වායුගෝලයේ අඩුවෙන් ම පවතින වායු වර්ග අඩංගු පිළිතුර මේවායින් කුමක් ද?

(1). ඕසෝන්, නියෝන්, හීලියම් (2). හීලියම්, නියෝන්, ක්‍රිප්ටන්

(3). නයිට්‍රජන්, හීලියම්, ඕසෝන් (4). කාබන්ඩයොක්සයිඩ්, හීලියම්, ඔක්සිජන්

32. තුන්ද්‍රා දේශගුණය ආශ්‍රිත ප්‍රදේශවල පමණක් දැකිය හැකි ලක්ෂණ අඩංගු වන්නේ මින් කවර පිළිතුරේ ද?

(1). උෂ්ණත්වය අවම වීම, තුහින, වර්ෂාව 1500 ට වැඩි වීම.

(2). හිමපතනය, ශීත දේශගුණය, උෂ්ණත්වය අවම වීම.

(3). උෂ්ණත්වය අවම වීම, හිමපතනය, අධික වර්ෂාපතනය

(4). මෝසම් වර්ෂාව, ශීත දේශගුණය, ශීත ඍතුව

33. ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ලබාදෙන ප්‍රධාන අපනයන බෝගයක් නොවන්නේ,

(1). තේ (2). පොල් (3). රබර් (4). ඉඟුරු

34. අභ්‍යවකාශයේ සිට පෘථිවිගෝලය වෙත පතිත වන උල්කාෂ්ම බොහොමයක් දැවී විනාශ වී යන්නේ මින් කවර වායුගෝලීය ස්ථරයේ ද?

(1). පරිවර්ති ගෝලය තුළ ය. (2). අපරිවර්ති ගෝලය තුළ ය.

(3). මෙසෝ ගෝලය තුළ ය. (4). අජට ගෝලය තුළ ය.

35. පෘථිවි ආදර්ශ ගෝලයේ දකුණු අක්ෂාංශ 66 ½$^{o}$ හඳුන්වන්නේ,

(1). මකර නිවර්තනය ලෙස ය. (2). කර්කටක නිවර්තනය ලෙස ය.

(3). ඇන්ටාක්ටික් වෘත්තය ලෙස ය. (4). ආක්ටික් වෘත්තය ලෙස ය.

36. වියළි කලාපීය එළවළු පමණක් අඩංගු පිළිතුර වන්නේ,

(1). මුරුංගා, වම්බටු, කැරට් (2). මුරුංගා, වම්බටු, වට්ටක්කා

(3). මුරුංගා, ගෝවා, කරවිල (4). ගෝවා, කරවිල, මෑ කරල්

37. අවුරුද්ද මුළුල්ලේ ඉහළ උෂ්ණත්වයක් පැවතීම, අවුරුද්ද පුරා පැතුරුණු වර්ෂාපතනය, වර්ෂාපතනයේ විවිධත්වයක් පැවතීම, මෙම ලක්ෂණ ඇතුළත් දේශගුණ වර්ගය වන්නේ,

(1). නිවර්තන දේශගුණය (2). සෞම්‍ය දේශගුණය (3). මධ්‍යධරණි දේශගුණය (4). ශීත දේශගුණය

38. ශාක පත්‍රවල ඇති ජලය වායුගෝලයට එකතු වන්නේ,

(1). වර්ෂාව මගිනි. (2). වාෂ්පීකරණය මගිනි. (3). උත්ස්වේදනය මගිනි. (4). ඝනීකරණය මගිනි.

39. අර්ධ වශයෙන් ගොබිම්වලින් වට වූ මුහුදකි.

(1). එරල් මුහුද (2). ජපන් මුහුද (3). රතු මුහුද (4). (රතු) චීන මුහුද

40. ලෝකයේ විශාලම දූපත වන්නේ,

(1). ස්කොට්ලන්තය (2). අයිස්ලන්තය (3). ග්‍රීන්ලන්තය (4). මැඩගස්කරය

***

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | විෂයය - භූගෝල විද්‍යාව | පත්‍රය II | පැය - 02 යි. |
|---|---|---|---|

**සැලකිය යුතුයි.**

- මෙම ප්‍රශ්න පත්‍රය **I** හා **II** වශයෙන් කොටස් 2කි.
- **I** කොටස **අනිවාර්ය** වේ. **II** කොටසින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **පහකි.**

## I කොටස

01. (අ). ඔබ අධ්‍යයනය කොට ඇති 1 : 50 000 භූ ලක්ෂණ සිතියම් පිළිබඳ දැනුම භාවිත කොට පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i). වර්තමානයේ දී විවිධ වූ භූගෝලීය තොරතුරු ඉතා ම නිවැරදි ව සිතියම්ගත කිරීම සඳහා භාවිත කරන ක්‍රම 2ක් ලියන්න. (ලකුණු 02)

(ii). සිතියම බෙදා දක්වන වර්ග 2 කුමක් ද? (ලකුණු 02)

(iii). 1 : 50 000 සිතියමක සමෝච්ච රේඛා අතර අන්තරය කොපමණ ද? (ලකුණු 01)

(iv). ශ්‍රී ලංකාව බෙදා ඇති 1 : 50 000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියම් ගණන දක්වන්න. (ලකුණු 01)


(v). 7 km දිග මාර්ගයක් 1:50 000 පරිමාණයේ සිතියමක නිරූපණය කරනු ලබන සෙන්ටිමීටර් ගණන දක්වන්න. (ලකුණු 01)

(vi). පහත සඳහන් සංකේත නියමිත හැඩයෙන් හා වර්ණයෙන් අඳින්න.

(අ) පළාත් මායිම (ආ) පාසල (ලකුණු 02)

(vii). ශ්‍රී ලංකාවේ කොළඹ සිට සංගමන්කන්ද තුඩුව දක්වා පළල කොපමණ ද? (ලකුණු 01)

(ආ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i). සිතියමෙහි ලකුණු කොට ඇති අක්ෂරවලින් ලොස් ඇන්ජලීස් දැක්වෙන අක්ෂරය වන්නේ කුමක් ද?


(ii). සිතියමෙහි ලකුණු කොට ඇති අක්ෂරවලින් ලෝකයේ ජනගහනය වැඩිම රට දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii). සිතියමෙහි ලකුණු කොට ඇති අක්ෂරවලින් මැඩගස්කරය දැක්වෙන අක්ෂයර කුමක් ද?

(iv). සිතියමෙහි ලකුණු කොට ඇති අක්ෂරවලින් ඇමසන් වනාන්තරය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v). සිතියමෙහි ලකුණු කොට ඇති අක්ෂරවලින් ඇන්දීස් කඳු වැටිය දැක්වෙන අක්ෂය කුමක් ද? (ලකුණු 05)

(ඉ) ඔබ වෙත සපයා ඇති ලංකා සිතියම හොඳින් අධ්‍යයනය කොට පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i). සිතියමෙහි ලකුණු කොට ඇති අක්ෂරවලින් මහවැලි ගඟ දැක්වෙන අක්ෂරය කුමක් ද?

(ii). සිතියමෙහි ලකුණු කොට ඇති අක්ෂරවලින් කොළඹ දිස්ත්‍රික්කය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iii). සිතියමෙහි ලකුණු කොට ඇති අක්ෂරවලින් දෙවුන්දර තුඩුව දැක්වෙන අක්ෂරය කුමක් ද?

(iv). සිතියමෙහි ලකුණු කොට ඇති අක්ෂරවලින් ත්‍රිකුණාමලය වරාය දැක්වෙන අක්ෂරය කුමක් ද?

(v). සිතියමෙහි ලකුණු කොට ඇති අක්ෂරවලින් මන්නාරම් දූපත දැක්වෙන අක්ෂරය කුමක් ද? (ලකුණු 05)

## II කොටස

02. පෘථිවියේ භෞතික ලක්ෂණවලට ප්‍රධාන තැනක් හිමි වේ.

(i). මහාද්වීප තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii). ආසියා මහාද්වීපික තටකය තුළ පිහිටා ඇති දූපත් දෙකක් නම් කරන්න. (ලකුණු 02)


(iii). ඇන්ඩීස් හා රොකී කඳු වැටිය පිහිටා ඇති මහාද්වීප දෙක නම් කරන්න. (ලකුණු 02)

(iv). පහත භූ රූපවලින් තුනක් අර්ථ දක්වන්න.

| | | |
|---|---|---|
| 1. මහාද්වීප | 4. මුහුදු | 7. තැනිතලා |
| 2. දූපත් | 5. කඳුවැටි | |
| 3. සාගර | 6. සානු | |

(ලකුණු 03)

03. පෘථිවි ව්‍යුහයේ ප්‍රධාන ස්තර තුන දැක්වෙන හරස්කඩක් යාබද රූපයෙන් දක්වා ඇත.




(i). රූප සටහනට අනුව 1 හා 2 අංකවලින් දක්වා ඇති ස්ථර දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(ii). රූප සටහනේ අංක 2 හා 3 දැක්වෙන ස්ථර වෙන් කෙරෙන සීමාව වලින් දක්වා ඇත. එය හඳුන්වන නම කුමක්ද? (ලකුණු 01)

(iii). අංක 3 න් දැක්වෙන ස්ථරයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(iv). අංක 1 න් දැක්වෙන ස්ථරය සකස් වී ඇති කොටස් දෙක නම් කරන්න. (ලකුණු 02)

(v). මෙම ස්ථරය මිනිස් කටයුතු කෙරෙහි බලපාන ආකාරය කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 03)


04. අපගේ වාසභූමිය වන පෘථිවියේ සංයුතිය ඉතා වැදගත්දෙයකි.

(i). පෘථිවි පද්ධතියේ උප පද්ධති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii). පරිවර්ති ගෝලයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii). ජල ගෝලයේ ගුණාත්මකභාවය අඩුවීම කෙරෙහි මිනිස් ක්‍රියාකාරකම් බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

- ප්‍රශ්න අංක 05 සහ 06 සඳහා පහත දී ඇති ලෝක සිතියම උපයෝගී කර ගන්න.




05. (i). සිතියමේ A හා B අක්ෂරවලින් දැක්වෙන තිරිඟු වගා කරන රටවල් දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(ii). C හා D අක්ෂරවලින් දැක්වෙන ආසියාවේ වී වගා කරන රටවල් දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02)

(iii). වී හා තිරිඟු නිෂ්පාදනය ආශ්‍රිත දැකිය හැකි සමාන ලක්ෂණයක් ලියන්න. (ලකුණු 01)

(iv). ලෝකයේ වී වගාව ව්‍යාප්ත වීම කෙරෙහි බලපාන භෞතික සාධක දෙකක් ලියන්න. (ලකුණු 02)

(v). ලෝකයේ වී වගාව ආශ්‍රිත විශේෂ ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

06. (i). ලෝකයේ යකඩ හා වානේ කර්මාන්තය සිදු කරන, E අක්ෂරයෙන් දැක්වෙන ආසියාතික රට ද F අක්ෂරයෙන් දැක්වෙන දකුණු ඇමරිකාවට අයත් රට ද නම් කරන්න. (ලකුණු 02)

(ii). කර්මාන්ත ස්ථානගත වීමට බලපාන සාධක තුනක් ලියන්න. (ලකුණු 03)

(iii). යකඩ හා වානේ නිෂ්පාදන යොදා ගන්නා ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iv). යකඩ හා වානේ කර්මාන්තයේ ප්‍රවණතා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

07. (i). ලෝකයේ ප්‍රධාන කෘෂිකාර්මික භූමි පරිභෝග වර්ග දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii). තිරිඟු වගාව සඳහා බලපාන භෞතික සාධක තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii). වාණිජ පදනමකින් වී වගා කරන රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iv). ලෝකයේ ජනතාව අතර තිරිඟු ආහාරයක් ලෙස ජනප්‍රිය වීමට හේතු වී ඇති කරුණු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 03)

08. අතීතයේ සිට ම ශ්‍රී ලංකාවේ වගා කෙරෙන ප්‍රධාන ආහාර බෝගය ලෙස වී වගාවට වැදගත් තැනක් හිමි වී තිබේ.

(i). යාබද සිතියමේ අංක 2 හා 3 න් දැක්වෙන ශ්‍රී ලංකාවේ වී වගා කරන කලාප දෙක නම් කරන්න. (ලකුණු 02)


(ii). අංක 4 න් දැක්වෙන කලාපයේ වී වගාව සිදු කරනු ලබන ක්‍රමය කුමක් ද? (ලකුණු 01)

(iii). අංක 1 න් දැක්වෙන කලාපය අයත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(iv). ඉහත සිතියෙම් අංක 2 න් දැක්වෙන කලාපය ඇසුරින් පහත සඳහන් කරුණුවලට අදාළ පිළිතුරු සපයන්න.

1. ජල අවශ්‍යතාවය සපුරා ගන්නා ආකාරය
2. බිම් ඒකකයකින් ලබන අස්වනු ප්‍රමාණය
3. යන්ත්‍ර සූත්‍ර භාවිතය (ලකුණු 03)

(v). ශ්‍රී ලංකාවේ වී පර්යේෂණ ආයතන දෙකක් නම් කරන්න. (ලකුණු 02)



[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

| 10 ශ්‍රේණිය | විෂයය - භූගෝල විද්‍යාව | පිළිතුරු පත්‍රය |
|---|---|---|

## I පත්‍රය

01. 510 වර්ග කිලෝමීටර් මිලියන
02. ශිලා ගෝලය
03. ගුටෙන්බර්ග් ආසන්නතිය
04. සානුවකට
05. උල්පතකිනි
06. බෝම්බුවල
07. කොළඹ
08. ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ
09. අපරිවර්තී ගෝලය)
10. නිෂ්පාදනය
11. නි
12. නි
13. වැ
14. වැ
15. නි
16. BCA - (2).
17. CDAB – (4).
18. CAB – (1).
19. BCAD – (2).
20. CAB – (1).
21. විල්
22. මහද්වීපික
23. ග්‍රැනයිට්
24. ජලගෝලයෙහි සීමාව
25. 20 m
26. 432 km
27. පොල් වගාවටය
28. රත්නපුර
29. තලවකැලේය
30. හෙල්මලු
31. 2
32. 2
33. 4
34. 2
35. 1
36. 2
37. 1
38. 3
39. 2
40. 3

## II පත්‍රය

### I කොටස

01. (අ). (i). GPS / GIS / RS තාක්ෂණය
 (ii). තේමා සිතියම් / භූලක්ෂණ සිතියම්
 (iii). 20 m
 (iv). 92 කි.
 (v). 14 cm
 (vi). නියමිත වර්ණයෙන් ඇඳ ඇත්නම් ලකුණු දෙන්න.
 (vii). 224 km

(ආ) ලෝක සිතියම

(i). A

(ii). D

(iii). C

(iv). B

(v). I

(ඉ) ලංකා සිතියම

(i). A

(ii). G

(iii). F

(iv). B

(v). E

## II කොටස

02. (i). ආසියා / අප්‍රිකා / යුරෝපා / ඔස්ට්‍රේලියා / ඇමරිකා මහද්වීප

(ii). බෝර්නියෝ ජාවා, සුමාත්‍රා, ශ්‍රී ලංකා

(iii). උතුරු ඇමරිකා හා දකුණු ඇමරිකා මහද්වීප

(iv). පෙළපොතේ 17 වැනි, 18 වැනි පිටුවල සඳහන් ඕනෑම විෂයට අදාළ කරුණක් බැගින් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

03. (i). කබොල හා පහළ ප්‍රාවරණයයි.

(ii). ගුටෝබර්ග් ආසන්තතිය

(iii). ද්‍රව්‍යමය ලෝහවලින් (නිකල් + යකඩ) වලින් සමන්විතය.

ප්‍රාවරණයේ සිට 2250 Km පමණ ගැඹුරට විහිදේ.

(iv). මහද්වීපික කපොල / සාගරික කපොල

(v). ඛනිජ සම්පත් ලබා ගැනීම. / වනාන්තර එළිපෙහලි කිරීම. / මතුපිට භූ දර්ශනය වෙනස් කිරීම. / කර්මාන්ත ශාලා ගෘහස්තව සිදුවන අපද්‍රව්‍ය බැහැර කිරීම. / භූගත ජල මට්ටම වෙනස් වීම.

04. (i). වායුගෝලය / ශිලා ගෝලය / ජල ගෝලය / ජෛව ගෝලය

(ii). පෘථිවි පෘෂ්ඨයේ සිට 8 – 12 km පමණ ඉහළට විහිදේ.

උන්නතාංශය සමග උෂ්ණත්වය ක්‍රමයෙන් පහළ බසී.

වර්ෂණය, උෂ්ණත්වය, පීඩනය, සුළං, ආර්ද්‍රතාව, වලාකුලු වර්ධනය වැනි සියලු කාලගුණික සිදුවීම්.

(iii). ජල ගෝලයෙහි ගුණාත්මක බව නැති කිරීමට බලපාන සාධක

කර්මාන්ත සඳහා යොදා ගන්නා ජලය අපවිත්‍ර ජලය ලෙස පිටකිරීමේදී විවිධ රසායනික හා කාබනික ද්‍රව්‍ය ජලයට එක්වීම.

කෘෂි කර්මාන්තයේ දී පසට එකතු කරන පොහොර වර්ග, කෘෂි රසායන ද්‍රව්‍ය ජලය සමග මිශ්‍රවීම.

මල ද්‍රව්‍ය, අපවහනය නිසා මතුපිට ජලය සහ භූගත ජලයට අපද්‍රව්‍ය එකතු වීම.

05. (i). A - ඉන්දියාව B - රුසියාව

(ii). C - ඉන්දුනීසියාව D - චීනය

(iii). ලොව වැඩියෙන්ම නිෂ්පාදනය හා පරිභෝජනය කෙරෙන භෝග දෙකක් වීම.

(iv). මෙම ප්‍රදේශවල පවතින 27 ක උෂ්ණත්වය

2000 mm පමණ වර්ෂාපතනය / දියලු පස / කඳුකර බිම්වල හෙල්මලු වී වගා ක්‍රමය

(v). කුඩා ගොවිබිම් වල වගා කිරීම

ඇතැම් රටවල ව්‍යාපාරික මට්ටමින් විශාල ගොවිබිම්වල වගා කිරීම.

ඉන්දියාව, ජපානය, ඇමරිකා එක්සත් ජනපදය, චීනය, පකිස්ථානය, තායිලන්තය, වියට්නාමය වැනි රටවල් වාණිජ පදනමකින් වී වගා කිරීම.

ආසියාතික රටවල ශ්‍රම සූක්ෂම වගාවක් වන අතර, ආසියාවෙන් බැහැර ප්‍රදේශවල විශාල වශයෙන් යන්ත්‍ර සූත්‍ර භාවිතා වීම.

වර්තමානයේ ඓන්ද්‍රීය නොහොත් භාවිතය කෙරෙහි වැඩි අවධානයක් යොමු වීම.

විශේෂ ගුණාංගවලින් යුත් සහල් නිෂ්පාදනය කිරීම.

(36 පිටුවේ සඳහන් මෙවැනි කරුණු වලින් දෙකක් ලියා විස්තර කර ඇත්නම් ලකුණු දෙන්න.)

කරුණු - 2 ලකුණු 2

විස්තරයට ලකුණු 1

06. (i). E - ජපානය F - බ්‍රසීලය

(ii). බලය / ප්‍රවාහනය / ප්‍රාග්ධනය / ශ්‍රමය / වෙළඳපොළ / යටිතල පහසුකම් / රාජ්‍ය ප්‍රතිපත්ති

88 පිටුවේ සඳහන් සාධක ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(iii). මෝටර් රථ කර්මාන්තය

නැව් තැනීමේ කර්මාන්තය

විද්‍යුත් (ඉලෙක්ට්‍රෝනික් කර්මාන්තය)

(iv). යකඩ හා වානේවල ඇති විවිධ ගුණ ලක්ෂණ (කල් පැවැත්ම, ශක්තිය, දරා සිටීමේ හැකියාව, නම්‍යශීලී බව, කම්පනයට ඔරොත්තු දීම, ලාභදායී නිෂ්පාදනය)

වෙනත් ලෝහවලට මිශ්‍ර කිරීමෙන් ගුණාත්මක භාවය වැඩි දියුණු කරගත හැකිවීම.

භාවිතා කළ පසුව ප්‍රතිචක්‍රීකරණය කළ හැකිවීම.

මූලික ලෝහයක් ලෙ ලොව සෑම රටක්ම විවිධ වූ නිෂ්පාදන සඳහා යොදා ගැනීම.

අතීතයේ පැවැති පාරම්පරික තාක්ෂණයෙන් ඉවත් වී නිෂ්පාදන කටයුතු නවීකරණය වීම.

(මෙවන් තවත් කරුණු ලියා ඇත්නම් ලකුණු දෙන්න.)

07. (i). වී, තිරිඟු

(ii). 300 mm – 500 mm අතර වර්ෂාපතනය

පැල වැඩෙන කාලයේ සිසිල් තෙත් දේශගුණය

හොඳින් ජලය බැසයන තැනිතලා බිම්

චර්නෝසම් පස

(iii). ඉන්දියාව / ජපානය / ඇමරිකා එක්සත් ජනපදය / චීනය / පකිස්ථානය / තායිලන්තය / වියට්නාමය

(iv). ලොව වැඩි වශයෙන් නිෂ්පාදනය හා පරිභෝජනය කරන ධාන්‍ය වර්ග අතරින් තිරිඟුවලට වැදගත් තැනක් හිමිවේ.

විවිධාකාරයෙන් සකස් කොට මිනිස් පරිභෝජනය සඳහා භාවිතා කරන අතර අතුරුඵල සත්වාහාර ලෙස ද භාවිතා කෙරේ.

08. (i). අංක 2 - අතරමැදි කලාපය අංක 3 - තෙත් කලාපය

(ii). හෙල්මලු ක්‍රමයට වී වගා කෙරේ.

(iii). අනුරාධපුර, පොලොන්නරුව, වව්නියා, අම්පාර, හම්බන්තොට, මඩකලපුව, යාපනය

(iv). 1. වැසි ජලයෙන් හා ජල සම්පාදනයෙන්

2. බිම් ඒකකයින් ලැබෙන අස්වනු ප්‍රමාණය වැඩිය.

3. යන්ත්‍ර සූත්‍ර භාජනය බහුලයි.

(v). බෝඹුවල වී පර්යේෂණායතනය

අම්බලන්තොට වී පර්යේෂණායතනය

හිගුරක්ගොඩ වී පර්යේෂණායතනය

මහඉලුප්පල්ලම වී වර්යේෂණායතනය

බතලගොඩ වී පර්යේෂණායතනය



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න